අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | ED/12/01/19/06/01/2025 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.08. 23 |

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන්,

**<u>ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇති ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/Trans/V/වා.ස්.මා./2025 හා 2024.07.29 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2024 හා බැඳේ.

02. ඒ අනුව ඔබ කාර්යාලය/විද්‍යාපීඨය/විද්‍යාලය/ආයතනය මඟින් පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කරනු ලබන ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්, ඉහත චක්‍රලේඛයේ උපදෙස් පරිදි පහත සඳහන් කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

I. ස්ථාන මාරු අයදුම් කරන සියලුම නිලධාරීන් මාර්ගගත මෘදුකාංගය (Online Application) තුළට පිවිස වාර්ෂික ස්ථානමාරු අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් (Submit) කර, එහි දෘඩ පිටපත (Hard Copy) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම සඳහා ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව **2024.08.26 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සාමාන්‍ය ආයතන (ඒකාබද්ධ සේවා) ශාඛාව, දෙවන මහළ, අධ්‍යාපන අමාත්‍යාංශය** යන ලිපිනය වෙත යොමු කිරීම අනිවාර්ය වේ.

II. **2024.12.31** දිනට අදාළ සේවා ස්ථානයේ වසර 05ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ තොරතුරු මාර්ගගත මෘදුකාංගය (Online Application) ඔස්සේ අනිවාර්යයෙන්ම යාවත්කාලීන කර එහි දෘඩ පිටපත (Hard Copy) ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම සඳහා **2024.08.26 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, සාමාන්‍ය ආයතන (ඒකාබද්ධ සේවා) ශාඛාව, දෙවන මහළ, අධ්‍යාපන අමාත්‍යාංශය** යන ලිපිනය වෙත ඉදිරිපත් කළ යුතුය.

III. එක් නිලධරයෙකු එක් අයදුම්පතක් පමණක් යොමු කළ යුතුය.

IV. වාර්ෂික ස්ථාන මාරු නියෝග යටතේ ස්ථාන මාරු චක්‍රයන්වල සිටින අනෙකුත් නිලධරයන් අගතියට පත්වන බැවින්, නිලධරයෙකුගේ ඉල්ලීමක් අනුව ලබාදෙන ස්ථාන මාරුවීමක් අවලංගු කිරීම, කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීම හෝ ඒ සඳහා සේවා අවශ්‍යතාවය හේතුවක් ලෙස යොදා ගැනීම ආදිය නිර්දේශ කිරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු නොකළ යුතු අතර, කිසියම් සාධාරණ හේතුවක් ඇත්නම් අදාළ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම නිර්දේශ කිරීමේදී ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු වේ.

V. තව ද වෛද්‍ය සහතික මඟින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙළෙන ස්ථාන මාරු නොකළ යුතු නිලධරයන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් පුද්ගලිකවම සනාථ කළ යුතු අතර, ස්ථාන මාරු ලැබීමට ඉඩ ඇතැයි සිතෙන විශේෂ පුහුණු ලබා ඇති කිසියම් නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම ආයතනය තුළ රඳවා ගත යුතු යැයි ආයතන ප්‍රධානියා අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත් යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පැහැදිලිව සඳහන් කළ යුතුය. (වසර 05 ට වඩා සේවා කාලයක් සහිත එවැනි නිලධරයන් සිටීනම් එම කරුණු පිළිබඳව වසර 05 ට වඩා සේවය කළ නිලධරයන්ගේ ලේඛනයේ ඔවුන්ගේ නම ඉදිරියෙන් වෙනත් කරුණු යටතේ ද සඳහන් යුතු කළ යුතුය)

VI. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතු වේ. තවද, සාවද්‍ය තොරතුරු අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන නිලධරයන් වගකීමට බැඳී සිටින අතර සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**ආර්.බී. ගන්කේවල**
**අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)**
**අධ්‍යාපන ලේකම් වෙනුවට**